**www.wsws.org** ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ පොලීසිය සසප සාමාජිකයාගේ ඥාතියා යලි අත් අඩංගුවට ගනී

## Sri Lankan police re-arrest relative of SEP member

**නන්ද වික්‍රමසිංහ විසිනි**
**2008 නොවැම්බර් 12**

සැප්තැම්බර් මාසයේ දී සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) සාමාජික වේලුම්මයිලුම් කමල්දාසන් සමග අත් අඩංගුවට ගෙන රඳවා ගනු ලැබූ චන්ද්‍රලිංගම් ඉලන්චේලියන් ශ්‍රී ලංකාවේ පොලීසිය විසින් පසුගිය මාසයේ දී යලිත් අත් අඩංගුවට ගන්නා ලදි. සසප සහ *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* විසින් ගෙන යනු ලැබූ උද්ඝෝෂනයකට පසුව නිදහස් කිරීමට පෙරාතුව ඔවුහු දෙදෙනා කිසිදු චෝදනාවකින් තොරව දින අටක් තිස්සේ රඳවා තබා ගැනුනි.

ඉලන්චේලියන් ඔක්තෝබර් 3 දා බටහිර වෙරල බඩ නගරයක් වන මීගමුවේ දී අත් අඩංගුවට ගන්නා ලදි. එහෙත් ඒ පිලිබඳව සසපට දැන ගන්ට ලැබුනේ සති දෙකකටත් වැඩි කලකට පසුව ය. සසප පෙර උද්ඝෝෂනයේ බලපෑම ගැන මැනවින් දැන සිටි මීගමුව පොලීසිය පක්ෂයට දැනුම් නොදෙන ලෙස ඉලන්චේලියන්ගේ ඥාතීන්ට අනතුරු ඇගවූයේ එය ඔහු නිදහස් කර ගැනීම තවත් අසීරු කිරීමට පමනක් හේතු වනු ඇති බව පවසමිනි.

ශ්‍රී ලංකාවේ දරුනු හදිසි නීති රෙගුලාසි යටතේ ඉලන්චේලියන් දැන් මසකටත් වැඩි කලක් රඳවා ගෙන සිටිනු ලැබ ඇත. නඩු විභාගයකින් හෝ චෝදනාවකින් තොරව පුද්ගලයන් දිගු කාලයක් රඳවා ගැනීමට එම නීති මගින් ඉඩ සැලසෙයි. මීගමුව පොලීසිය ඔක්තෝබර් 31 දා ඔහු මහේස්ත්‍රාත්වරයකු ඉදිරියට පමුනුවා රඳවා ගැනීමේ කාලය තව සති තුනකින් දීර්ඝ කර ගත්හ. මෙම ක්‍රියාදාමය තථ්‍යසම ලෙස දින නියමයක් නැතිව දිගට ම ගෙන යා හැකි ය.

ආන්ඩුව 2006 මැද දී රට යලි යුද්ධයට ඇද දැමීමේ පටන් දෙමල ජාතිකයන් දහස් ගනනක්, දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට ආධාර කිරීම හෝ එහි සාමාජිකයකු වීම යන තහවුරු නොකෙරුනු චෝදනා යටතේ අත් අඩංගුවට ගෙන සති ගනන් හෝ මාස ගනන් රඳවා ගෙන තිබේ.

කමල්දාසන් සහ ඔහුගේ මස්සිනා වන ඉලන්චේලියන් මුලින් ම අත් අඩංගුවට ගනු ලැබුවේ, සැප්තැම්බර් 15 දා මීගමුවේ සිට කොලඹ බලා එන බසයක ගමන් කරමින් සිටිය දී සිය අනන්‍යතාව ප්‍රමානවත් පරිදි ඔප්පු නොකිරීම යන පදනම මත ය. ඔවුන් දින අටක් තිස්සේ රඳවා ගනු ලැබුවේ කමල්දාසන් දිගු කාලීන පක්ෂ සාමාජියකු බවට සසප සහතික ලෙස කියා සිටීම ද නොතකා ය. ආන්ඩුවේ වර්ගවාදී යුද්ධයට පමනක් නොව එල්ටීටීඊයේ බෙදුම්වාදී දේශපාලනයට හා සිංහල සිවිල් ජනයාට එරෙහි එහි ප්‍රහාරවලට ද පවත්නා සිය විරුද්ධත්වය පිලිබඳව සසප ශ්‍රී ලංකාව තුල ප්‍රචලිත ය.

ඉලන්චේලියන් හා කමල්දාසන් අවසානයේ සැප්තැම්බර් 23 දා නිදහස් කරන ලදි. ඔවුන් "ත්‍රස්තවාදී ක්‍රියාවන්ට කිසිදු ආකාරයකින් සම්බන්ධ බවට තම "වැඩි දුර පරීක්ෂන" මගින් මොන යම් හෝ සාක්ෂ්‍යයක් සොයා ගත නොහැකි වූ බව ඔවුන් නිදහස් කරන ලෙස ප්‍රාදේශීය මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කල ආකාරගත වාර්තාව තුල පොලීසිය පිලිගත්තේ ය. කොලඹ ත්‍රස්ත විමර්ශන ඒකකය (ටීඅයිඩී) සහ ඔවුන් දෙදෙනා මුලින් පදිංචිව සිටි යාපනයේ කරෙයිනගර් පොලිස් ස්ථානය වෙතින් මීගමුව පොලීසිය වාර්තා ඉල්ලා තිබුනි.

ඉලන්චේලියන් යලි අත් අඩංගුවට ගත්තේ අතිශයින් ම දුර්වල පදනමක් මත ය. පොලීසිය ඔහු අත් අඩංගුවට ගත්තේ චන්දිරන් නම් වෙනත් දෙමල ජාතිකයකු මැලේසියාවේ සිට මෙරටට පෙරලා පැමිනීමෙන් පසුව අත් අඩංගුවට ගැනීමෙන් අනතුරුව ය. තමන් මැලේසියාව බලා පිටත්ව යාමට පෙරාතුව 2004 දී ඉලන්චේලියන් සමග නැවතී සිටි බව චන්දිරන් පොලීසියට පැවසී ය. තමන් චන්දිරන් අත් අඩංගුවට ගත්තේ මන් ද යන වග පොලීසිය පැහැදිලි කොට නැති නමුත් ඔහුට එල්ටීටීඊය සමග සබඳතා පැවති බවට ඔවුන් අගවා තිබේ.

ඉලන්චේලියන්ගේ පවුලේ සාමාජිකයන්ට අනුව, චන්දිරන් යාපනයේ සිට මීගමුවට පැමිනීමෙන් පසුව ඉන්චේලියන් සමග නැවතී සිට තිබුනි. ඉලන්චේලියන් වත් ඔහුගේ පවුලේ සාමාජිකයන් වත් චන්දිරන්ගේ පසුබිම ගැන කිසිවක් දන්නේ නැත. ඉලන්චේලියන් කර තිබුනේ දැන හඳුනා ගත් අයෙකුට දින කිහිපයකට

නවාතැන් සැපයීම මගින් උදව්වක් කිරීම පමනි -- එත් වසර හතරකට ඉහත දී ය.

ඉලන්චේලියන් යලි අත් අඩංගුවට ගැනීමෙන් පසුව මීගමුව පොලීසිය ඔහුගේ නිවසට කිහිප වතාවක් ම පැමින තිබේ. ඔක්තෝබර් 21 දා, බෝම්බ හා පුපුරන ද්‍රව්‍ය සොයන බව කියාපාමින් පොලිස් නිලධාරිහු බල්ලන් ද සමග පැමින මුලු නිවසම අනෙක් පැත්ත පෙරලූහ. ඔවුන්ට කිසිදු අපරාධ සාක්ෂ්‍යයක් සොයා ගත නොහැකි වූ අතර මසකට වැඩි කලකට පසුවත් ඉලන්චේලියන්ට එරෙහිව කිසිදු නඩුවක් ගොනු කිරීමට ද අපොහොසත් වී ඇත.

පොලීසිය කමල්දාසන් සහ සසප ද ඉලක්ක කරමින් සිටිනවා විය හැකි බවට මෙම මෑතම අත් අඩංගුවට ගැනීම අනතුරු අඟවන පෙර නිමිත්තකි. ඔක්තෝබර් 3 දා ඉලන්චේලියන් අත් අඩංගුවට ගන්නා අවස්ථාවේ දී, උතුරේ යාපන නගරය බලා පිටත්ව ගොස් සිටි කමල්දාසන් ගැන ද පොලීසිය විමසීය.

සැප්තැම්බරයේ දී කමල්දාසන් සහ ඉලන්චේලියන් නිදහස් කිරීමෙන් මද කලකට පසුව, මීගමුව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි පී.කේ.එස්. විතාන පොලිස්පති වෙත යැවූ ලිපියක පැහැදිලි කලේ, "ඔවුන් ත්‍රස්තවාදී ක්‍රියාකාරකම්වලට සම්බන්ධ නැති බවට පරීක්ෂන ක්‍රියාදාමය තුල දී තොරතුරු ලැබී ඇති" බවයි. එම ලිපියේ පිටපතක් සසප ප්‍රධාන ලේකම් විජේ ඩයස් වෙත ද එවා තිබුනි.

කෙසේ වෙතත්, ඉලන්චේලියන් යලි අත් අඩංගුවට ගැනීමෙන් පසු වහාම විතාන ඔක්තෝබර් 9 දා ඩයස් වෙත ඍජුව ම ලියමින් වඩා තර්ජනාත්මක සටහනක් එකතු කලේ ය. ඔවුන්ට එරෙහිව සාක්ෂ්‍ය සොයා ගත නොහැකි වීමෙන් පසුව පොලීසිය දෙදෙනා නිදහස් කර ඇති බව පිලිගන්නා අතර ම, පොලිස් අධිකාරි මෙසේ ලිවී යඃ "මෙම පුද්ගලයා (කමල්දාසන්) සම්බන්ධයෙන් තව දුර පරීක්ෂන සිදු කෙරෙන බව (ඔබට) දැනුම් දීමට මම කැමැත්තෙමි." වෙනත් වචනවලින් කියතොත්, ලිපිගොනුව තවමත් වසා නැති අතර පොලීසිය කමල්දාසන් හඹා යාමෙහි දිගට ම යෙදී සිටිති.

මීගමුව පොලීසියේ ක්‍රියාවන් තුල පලිගැනීමේ අංගයක් තිබීමට බෙහෙවින් ම ඉඩ ඇත. සැප්තැම්බරයේ දී කමල්දාසන් සහ ඉලන්චේලියන් හිතුවක්කාරී හා නීති විරෝධී ලෙස අත් අඩංගුවට ගැනීම මෙතරම් ප්‍රසිද්ධියේ එලිදරව් කරනු ලැබීම ගැන ඔවුන් පැහැදිලිව ම කෝපයට පත්ව ඇත. එම අවස්ථාවේ සසප පෙන්වා දුන් පරිදි, ඔවුන් දෙදෙනා අත් අඩංගුවට ගැනීම ආන්ඩුවේ හදිසි නීති බලතල යටතේ ප්‍රකාශයට පත් කොට ඇති දරුනු රෙගුලාසි පවා උල්ලංඝනය කලේ ය.

එමෙන් ම, සසප, ආන්ඩුව මුහුනු දෙන අර්බුදය අවතක්සේරු කරන්නේ ද නැත. රට යලි යුද්ධයට ඇද දැමීමෙන් පසුව, ජනාධිපති මහින්ද රාජපක්ෂ ගැඹුරු වන ගෝලීය මූල්‍ය කඩාවැටීම මගින් සංකීර්න කෙරෙන විභව්‍ය ආර්ථික ව්‍යසනයකට මුහුන දී සිටී. ආන්ඩුවේ දැවැන්ත මිලිටරි වැය දැනට සියයට 30ක පමන මට්ටමේ තිබෙන උද්ධමනය අවුලුවාලීමට දායක වී ඇති අතර එය පුලුල්ව පැතිරුනු දේශපාලන අසහනකාරිත්වයක් ද නිර්මානය කර තිබේ.

වර්ජනය කරන කම්කරුවන් සහ විරෝධය දක්වන ශිෂ්‍යයන් හා ගොවීන් ඇතුලු කොටස්වලින් එල්ල වන ඕනෑම විරුද්ධත්වයකට ආන්ඩුවේ ප්‍රතිචාරය වී ඇත්තේ, ජාතික ආරක්ෂාවට වල කපන්නන් ලෙස ඔවුන් හෙලා දැකීම සහ "ත්‍රස්තවාදයට උදව් කරන" බවට ඔවුන්ට චෝදනා කිරීම යි. රටේ දෙමල සුලුතරයට එරෙහි ත්‍රස්ත තන්ත්‍රයට ඇතුලත් වන්නේ, හිතුවක්කාරී රඳවා ගැනීම පමනක් නොවේ. පසුගිය වසර දෙකක කාලය තිස්සේ සිය ගනනක් පැහැර ගැනීමට හෝ ඝාතනයට ලක් කොට ඇති, ආරක්ෂක හමුදා සමග සහයෝගීව ක්‍රියාත්මක වන, ඝාතක කල්ලි මුදාහැරීම ද එයට අයත් ය. ආන්ඩුව වඩා ගැඹුරු අර්බුදයකට ඇද වැටෙන කල, සිය විරුද්ධවාදීන් නිහඬ කරනු පිනිස ප්‍රකෝපකාරිත්වයන් හා ප්‍රචන්ඩත්වය යොදා ගැනීමට එය නොපැකිලෙනු ඇත.

ඉලන්චේලියන් යලි අත් අඩංගුවට ගැනීමට ද දෙමල ජනයාගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහිව වර්ධනය වන ප්‍රහාරයන්ට ද විරුද්ධ වන ලෙස කම්කරුවන්ගෙන් සහ තරුනයන්ගෙන් සසප ඉල්ලා සිටී. වාර්ගික රේඛා හරහා ඒකාබද්ධ වීමට ද ස්වකීය ස්වාධීන පන්ති අවශ්‍යතා සඳහා දේශපාලන අරගලයක් ගෙන යාමට ද, විශේෂයෙන් ම දැනටමත් 70,000කට අධික ජීවිත සංඛ්‍යාවක් බිලි ගෙන ඇති රටේ 25 වසරක ම්ලේච්ඡ යුද්ධය නතර කිරීමට ද, ආරම්භයක් ගැනීමට වැඩ කරන ජනතාවට හැකි වන්නේ එම පදනම මත ම පමනි.

© www.wsws.org